කැලණිය අධ්‍යාපන කලාපය

මධ්‍ය වාර්ෂික පරීක්ෂණය - 2016

ඉතිහාසය

9 ශ්‍රේණිය

කාලය:- පැය දෙකයි

i පත්‍රය

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

01 .බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව පුරා තම බලය ව්‍යාප්ත කිරීමට සමත් වූයේ කිනම් වර්ෂයේ දී ද?
i.1796 ii. 1798 iii. 1815 iv. 1802

02. තම ආරක්ෂාව පතා බ්‍රිතන්‍යයට පැමිණි ඕලන්ද පාලකයා වූයේ
i.ෆන් එංගල්බෙග් ය. ii. විලියම් කුමරුය
iii. ජෝන් ෆයිබස් ය iv. තුන්වන ජෝර්ජ් රජුය.

03.ද්විත්ව පාලන ක්‍රමය යටතේ බ්‍රිතාන්‍ය රජය විසින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කිරීම සඳහා පත්කර එවූ ආණ්ඩුකාරවරයා වූයේ,
i. ෆෙඩ්රික් නෝර්ත් ය ii.තෝමස් මේට්ලන්ඩ් ය
iii.ජෝන් ඩොයිලි ය iv.රොබට් බ්‍රවුන්ග්‍රින්ග් ය

04.ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ හා උඩරට ප්‍රදේශ වෙන් වෙන් වශයෙන් පැවති පාලන ප්‍රදේශ ඒකාබද්ධ කොට මුළු රටම පොදු එකම පාලන ක්‍රමයක් ආරම්භ කළේ කුමන ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ද?
i. කෝල්බෲක් ii.ඩොනමෝර් iii. සෝල්බරි iv. මැනිං

05. කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ව්‍යවස්ථාදායක සභාවට පත්වූ ප්‍රථම උගත් ශ්‍රී ලාංකික මන්ත්‍රීවරයා වූයේ ,
i. පොන්නම්බලම් අරුණාචලම් ii. ජී. බී. පානබොක්කේ
iii. පොන්නම්බලම් රාමනාදන් iv. එච්. සී. අබ්දුල් රහුමාන්

06.ඩොන්මෝර් කොමිසමේ නිර්දේශ ඇතුළත් ප්‍රකාශ මොනවා ද?
A - අනිවාර්යය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම .
B - සර්වජන ඡන්දබලය ක්‍රියාත්මක කිරීම.
C - ආණ්ඩුකාර වරයාගේ බලතල සංශෝධනය කිරීම.
D - ව්‍යවස්ථාදායක හා විධායක සභා ආරම්භ කිරීම.
i. AD ii. BC iii. AB iv. CD

07.ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ අධ්‍යාපනය පිළිබඳ විධායක කාරක සභාවේ සභාපති ධුරයට පත් වූයේ ,
i. ඩී.එස්. සේනානායක මහතා ii. ඩී. බී ජයතිලක මහතා
iii. ටී. බී. පානබොක්කේ මහතා iv. සී. ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා

08.ප්‍රධාන වශයෙන් කොළඹ මධ්‍යස්ථානය කොට ගෙන කිතුදහම හා අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම සඳහා පිහිට වූ මිෂනාරී සමාගම වූයේ,

i. බැප්ටිස්ට් මිෂනාරී සමාගම
ii. වෙස්ලියන් මිෂනාරී සමාගම
iii. චර්ච් මිෂනාරී සමාගම
iv. ඇමෙරිකානු මිෂනාරී සමාගම

09.ඇමෙරිකානු ජාතික හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමා හා රුසියානු ජාතික හෙලේනා බ්ලැවට්ස්කි මැතිණියගේ ශ්‍රී ලංකාවට පැමිණීම සිදුවූයේ ,

i. මිෂනාරී සමාගම පිහිටුවීමේ ප්‍රතිඵලයක් වශයෙනි .
ii. පානදුරා වාදය ප්‍රධාන කොටගත් පංච මහා වාදවල ප්‍රතිඵලයක් වශයෙනි.
iii. පරම විඥානාර්ථ සමාගම පිහිටු වීමේ ප්‍රතිඵලයක් වශයෙනි .
iv. බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය ඉදිරියට යාමේ ප්‍රතිඵලයක් වශයෙනි.

10. ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද ප්‍රථම දේශපාලන පක්ෂය වූයේ,

i. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි.
ii. එක්සත් ජාතික පක්ෂයයි.
iii.කම්කරු පක්ෂයයි.
iv. ලංකා සම සමාජ පක්ෂයයි.

- අංක 11 සිට 15 දක්වා වාක්‍ය නිවැරදි නම් ( නි ) යන්න ද වැරදි නම් (වැ) යන්න ද වාක්‍ය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

11. වලානේ සිද්ධාර්ථ හිමියන්ගේ පුරෝගාමීත්වයෙන් ඓතිහාසික පානදුරා වාදය පැවැත්වුණි. ( )

12. ප්‍රථම බෞද්ධ පුවත් පත වූ ලක්මිණි පහන 1862 ආරම්භ කෙරුණි . ( )

13.බ්‍රිතාන්‍ය රජය 1912 මැයි මස 31 දින සුරා බදු පණත සම්මත කිරීම තුළින් ශ්‍රී ලංකාව පුරා රා අරක්කු තැබෑරුම් ආරම්භ විය. . ( )

14. බ්‍රිතාන්‍ය පාලකයන් උඩරට ගිවිසුමේ කොන්දේසි වලට අනුව ක්‍රියා නොකිරීම 1848 නිදහස් සටනට පසුබිම් වූ හේතුවකි. ( )

15. විධායක කාරක සභා වෙනුවට අගමැති ප්‍රමුඛ කැබිනට් ක්‍රමයක් ඇතිකිරීම සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන යෝජනාවකි. ( )

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.
  (සිද්දිලෙබ්බෙ, ගල්ඔය, මුඩුබිම් පණත,ලංකා ජාතික සංගමය ,ටී.බී ජයා මහතා, ස්ටුවර්ඩ් මැකන්සි, පාර්ලිමේන්තු)

16. ............................................ ආණ්ඩුකාර වරයා විසින් 1840 පනවන ලද මුඩුබිම් පණත දෙවැනි නිදහස් අරගලයට හේතු විය.

17.ඉස්ලාම් ආගමික පුනර්ජීවන ව්‍යාපාරයේ පුරෝගාමියා වූයේ ................................ තුමා ය.

18. 1915 සිංහල මුස්ලිම් කෝලාහල, අමද්‍යප ව්‍යාපාර ...................... බිහිවීමට හේතු විය.

19. ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය වන ...................... ව්‍යාපාරය ඩී. එස් . සේනානායක මහතාගේ උත්සාහයේ ප්‍රතිඵලයකි.

20.1946 සෝල්බරි ආණ්ඩු ක්‍රමය මඟින් ............................... ආණ්ඩු ක්‍රමයකට අවශ්‍ය අංග සම්පූර්ණ විය

ii කොටස

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01).ඉතිහාසය විෂයය සඳහා දෙවන වාරය අවසානයේ කරන ලද පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාකාරකම ආශ්‍රයෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. ඇගයීම සඳහා ගුරුතුමිය ඔබට ලබා දුන් ක්‍රියාකාරකම කුමක් ද? (ලකුණු 02)
II. ක්‍රියාකාරකම සඳහා යොදාගත් මාතෘකාව කුමක් ද? (ලකුණු 02)
III. යොදාගත් ක්‍රියාකාරකමේ අරමුණු දෙකක් සඳහන් කරන්න? (ලකුණු 02)
IV. තොරතුරු ලබාගැනීම සඳහා උපකාර කරගත් මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)
V. ක්‍රියාකාරකමේදී ඔබ මුහුණ දුන් ගැටලුවක් සඳහන් කර එමගැටලුව විසඳා ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න ? (ලකුණු 03)
VI. මෙම ක්‍රියාකාරකමට සහභාගී වීම තුළින් ඔබ ලබාගත් අත්දැකීම් පිළිබඳ විස්තරයක් කරන්න? (ලකුණු 05)

02). i. ක්‍රි. ව. 1600 වකවානුවේ පෙරදිග වෙළඳ ආධිපත්‍ය පැතිරවීම සඳහා තරග කළ පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම නම් කරන්න. (ලකුණු 02)

ii. ක්‍රි. ව. 1797 මදුරාසි පාලන ක්‍රමයට විරුද්ධව අරගල කිරීමට හේතු වූ කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. 1797 විරෝධතා අරගලයට හේතු වූ කරුණු සොයා බැලීම සඳහා බ්‍රිතාන්‍යයන් විසින් පත් කළ ත්‍රි පුද්ගල කමිටුව සඳහන් කර, එම කමිටුව විසින් ඉදිරිපත් කළ යෝජනා හතරක් ලියා දක්වන්න. (ලකුණු 05)

03) i. ක්‍රි. ව. 1797 – 1805 මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර ෆෙඩ්රික් නෝර්ත් ගේ කාලයේ සිදුකළ ප්‍රතිසංස්කරණ දෙකක් ලියන්න. (ලකුණු 02

ii. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය බලය තහවුරු කිරීම සඳහා තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා ගත් ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ක්‍රි.ව. 1803 ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට හේතු දෙකක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05)

04).i. ක්‍රි.ව. 1815 බ්‍රිතාන්‍යයන්ගේ උඩරට ආක්‍රමණය සාර්ථක වීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. 1815 මාර්තු 02 දින අත්සන් කළ උඩරට ගිවිසුමේ වගන්ති දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. ක්‍රි.ව. 1848 නිදහස් සටන ගොවි ජනතාවගේ සටනක් ලෙස අර්ථ දක්වයි. කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05).i. පාර්ලිමේන්තුවට අයත් කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. 1910 කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ හා 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම

ප්‍රතිසංස්කරණයේ ඡන්ද බලය ක්‍රියාත්මක වූ ආකාරය වෙන් වෙන් වශයෙන් දක්වන්න (ලකුණු 04)

iii.1947 ක්‍රියාත්මක වූ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අග්‍රාණ්ඩුකාරවරයා සතු බලතල දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06).i. කිතු දහම ව්‍යාප්ත කිරීම සඳහා මිෂනාරි ව්‍යාපාරය අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. බෞද්ධ පුනර්ජීවනය සඳහා ගනු ලැබූ පියවරයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04

iii. අනගාරික ධර්මපාල තුමාගෙන් ජාතියට හා ආගමට සිදුවූ සේවාව පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

07). i. පහත සඳහන් එක් එක් සිද්ධිය සම්බන්ධ පුද්ගලයන්ගේ නම් ලියන්න

A හින්දු ආගමික පුනර්ජීවනය ව්‍යාපාරයේ පුරෝගාමියා වූයේ -

B තරුණ බෞද්ධ සංගමය පිහිටුවීමට පුරෝගාමියා වූයේ -. (ලකුණු 02)

ii. අමද්‍යප ව්‍යාපාරයේ මූලිකත්වය දැරූ නායකයින් හතර දෙනෙකු නම් කරන්න. (ලකුණු 04)

iii. 1948 ට පෙර බිහිවූ දේශපාලන පක්ෂ දෙකක් නම් කර ඉන් එක් දේශපාලන පක්ෂයක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 02)